ජගත් ජේ එදිරිසිංහ

# කැවූ

## 9

*මෙතෙක් කතාව*

*ප්‍රසිද්ධ රංගන ශිල්පිණියක වන නිරාශා විවාහ වී සිටින්නේ පෙරළිකාර චිත්‍රපට අධ්‍යක්ෂ වරයකු වන විදුල මුණසිංහ සමගින් ය. තදින් මත් ද්‍රව්‍ය වලට ඇබ්බැහි වී සිටින මදාරා වෛද්‍යසේකර විදුලට හමුවන්නේ ඔහු සේවය කළ රාජ්‍ය නොවන සංවිධානයට අයත් පුනරුත්ථාපන නිවස්නයකදී ය. සරසවියේ අවසන් පරීක්ෂණයෙන් ඉහළ ලකුණු ලබා දෙන බවට දුන් පොරොන්දුව මත මදාරා විශ්ව විද්‍යාලයේ කථිකාචාර්යවරයකු වන තිසර සූරියබණ්ඩාරතිසරගේ කාමරයට යයි. ඇය විනාශ කර දමන තිසර නිසා ඇය මත්ද්‍රව්‍ය ගන්නට පෙළැඹෙයි. මදාරා ගේ කතාව දැනගන්නා විදුල ඒ අනුසාරයෙන් සිනමා පටයක් සඳහා තිරනාටකය ලියයි. විදුල හා එකට සරසවි අධ්‍යාපනය ලැබූ අමාත්‍යාංශයක ලේකම්වරියක වන සමදරා විජේසුන්දර ඇගේ ඇමතිවරයාගේ වාර්තා චිත්‍රපටයක් විදුල ලවා නිම කරවා ගැනීමට වෙහෙසෙයි. විදුල එය ප්‍රතික්ෂෙප කරයි. පුනරුත්ථාපනයෙන් පසු නිවස්නයෙන් ඉවත්ව යන මදාරා විදුලගේ උපකාරයෙන් ව්‍යාපෘති නිලධාරිණියක ලෙස රැකියාවක් සොයා ගනියි. සිනමා ක්ෂෙත්‍රයේ තමන්ට වඩා පහළින් සිටි නිළියන් ඉදිරියටම යන ආකාරය දකින නිරාශා කැළඹෙයි. මේ අතර මදාරාගේ ව්‍යාපෘතියක් සඳහා ආදිවාසීන් හමුවට ඇය කැටුව යාමට විදුල කැමති වෙයි.*

*අද එතැන් සිට*

විදුල සිටියේ කළකිරුණ සිතකින් ය. බොහෝ බලාපොරොත්තු ඇතිව ලියූ තිරනාටකයට පණ දී ගැනීම තමා සිතනාවාට වඩා බෙහෙවින් අසීරු කාර්යයක් වන බව ඔහුට වැටහෙමින් තිබුණි.

සමාජය මේ තරම් අකර්මණ්‍යව නිද්‍රාශීලීව සිටීමට කැමැති මන්දැයි ඔහුට නොවැටහෙයි. අසාධාරණය එරෙහිව නැගී සිටින්නට ශක්තියක් ඇතියවුන් වේගයෙන් ක්ෂය වෙමින් සිටින බව පසුගිය දින කීපයේදී මුහුණ පාන්නට සිදුවූ සිදුවීම් පසක් කර දෙයි. සියල්ලෝම අසාමාන්‍ය ලෙස ආත්මාර්ථකාමී දිවි පැවැත්මකට සිර වෙමින් සිටිති. තම තමන්ගේ සීමා මායිම් සළකුණු කරගත් පසු ඒ සීමා තුළට වී තමාගේ වැඩක් බලාගෙන සිටීමේ ආවෘත දිවි පැවැත්ම වඩාත් පහසු යයි සැවොම අදහන්නේ යයි විදුල සිතුවේ ය. තමා පමණක් ඒ රැල්ලට එරෙහිව පිහිනන්නට වැර වෑයම් කළ යුතු දැයි වරෙක ඔහුට සිතුණි.

සමාජයීය ගැටලු වලට සංවේදී මිනිසුන් යනු තව දුරටත් ජීවත්වන සත්ව කොට්ඨාශයක් නොවන බව මේ අත්දැකීම් ඔහුට පසක් කරදෙයි. එයින් ජනිත වන අපේක්ෂා භංගත්වය දරා සිටින්නට නොහැකි තරම් කටුක ලෙස ඔහුට දැනෙයි.

සිනමා ක්ෂේත්‍රයේ නිර්මාණ ශිල්පියකු ලෙස යා යුතු දිග ගමනක් පිළිබඳ සිහිනයක් ඔහුගේ සිත තුළ විය. තවමත් නොමැරී පවතින ඒ ආවේගය සමහන් කරගන්නට මගක් ඔහු නොදනියි. සිත තුළ ඇවිලෙන ආවේගයෙන් නිදහස් වන වෙනත් මගක් නැත. ආත්ම ප්‍රකාශණය සඳහා තෝරාගත් සිනමාව හැර වෙනත් විකල්පයක් ඔහු නොදනියි. කෙසේ හෝ මේ නිර්මාණය බිහි කළ යුතුය යන අධිෂ්ඨානය ඔහු සිත තුළ දැඩිව නැගී එයි. දන්නා හඳුනන නිෂ්පාදකයන් සියලු දෙනාම ඉවත බලා ගනිද්දී මේ අරමුණ කරා යා හැකි වෙනත් විකල්පයක් සොයා ගත යුතු බව ඔහු වටහා ගෙන සිටියේ ය.

"ඔය හැටි කල්පනා කරන්න එපා.." නිරාශා ඔහු පය පාමුළ වාඩි වන අතර කීවා ය. ඔහු නිහඬව ම ඇගේ හිස කෙස් අතර සිය අතැඟිලි යැව්වේ ය. ".. ඔයා කැමති නම් මගේ පන්නිපිටියෙ ඉඩම් කෑල්ල විකුණලා සල්ලි ගන්න.. අපට පස්සෙ වෙනින් ඉඩමක් ගන්න පුලුවන්.." ඇය නැවත කීවා ය. ඔහු සුසුමක් හෙළනු ඇයට ඇසුනි.

ඔහු තම පය පාමුළ වාඩිවී සිටි නිරාශා ගේ මුහුණ දෝතින්ම අල්ලා ගත්තේ ය. ඇය ඔහුගේ දෑත් මත තම දෑත් තබා ගත්තා ය.

"අපි වෙන විදිහක් බලමු.. ඔයාටය කියල තියෙන එකම දේපළ විකුණන්න මගේ හිත දෙන්නෙ නැහැ.." ඔහු කීවේ ය.

"ෆිල්ම් එකට සල්ලි දාන්න කවුරුත් කැමති නැත්නම් අපි කොහොම හරි සල්ලි හොයා




ගන්න ඕනෙ නේද..?"

"අපි වෙන ක්‍රමයකින් හොයා ගමු.." ඔහු ගේ පහත් හඬ ඇයට ඇසුණි. ඔහු නැවත නිහඬ වූයේ කල්පනාවට වැටුණා නිසා යයි ඈ සිතුවා ය. අද දහවල් කළ පුවත්පත් සාකච්ඡාව පිළිබඳව මේ මොහොතේ ඔහුට කිව යුතු දැයි සිතාගත නොහැකිව නිරාශා ද කල්පනාවට වැටුණා ය. බොහෝ වේලාවක් නිහඬව සිටි ඈ සුසුමක් හෙළා කටහඬ අවදි කළා ය.

"අද රිදී සිනමා පත්තරෙන් මගෙන් ඉන්ටවිව් එකක් ගත්තා.."

ඔහු කිසිවක් නොකීවේ ය.

"මං සිනමාවෙන් ඈත් වෙලා ඉන්න එක ගැන තමයි වැඩියෙන්ම ඇහුවෙ.." නිරාශා ඔහු දෙස හැරී බලමින් කීවා ය. ඔහු හැඟීම් විරහිත බැල්මකින් ඈත බලා සිටිනු ඇය දුටුවා ය. ඔහු කුමක් හෝ කියා මේ කතාව ඉදිරියට ගෙන යාමට යම් සහයෝගයක් දෙනු ඇතැයි ඇය බලා සිටියා ය.

"මං කිව්වා දිගටම මේ විදිහට ඉන්න අදහසක් නැහැ.. හොඳ චරිතයක් ලැබුණොත් රඟපානවා කියලා.." නිරාශා නැගිට ඔහු ඉදිරියේ වූ පුටුවේ වාඩි වූවා ය. ".. මං මෙහෙම ඉන්න ඒකේ කිසිම තේරුමක් නැහැ විදුල .. බලන්න.. අපට යමක් කරන්නවත් අතේ මුදලක් තියෙනවද..? අලුතින් ෆිල්ම්ස් හැදෙනවා.. අලුත් අය ඉස්සරහට එනවා.. අපරාදෙ නේද මෙහෙම කාලෙ නාස්ති කරගෙන ඉන්න එක..?"

ඔහු සිනාසුණේ ය.

"මං කවදාවත් කියල තියෙනවද රඟපාන්න එපා කියලා..?" ඔහු ඇසුවේ ය. "..ඉට්ස් අප් ටු යූ.. හොඳ ෆිල්ම්ස් වල විතරක් රඟපානවා කියලා තීරණය කළේ ඔයාමයි.. ඒ ස්ථාවරයේ දිගටම ඉන්නවද නැද්ද කියලා තීරණය කරන්න ඕනෙත් ඔයාමයි නේද..?"

විදුල කියන්නේ සැබෑවක් බව නිරාශා දනියි. ඔහු කිසිම දිනෙක තමන්ගේ නිදහසට එරෙහිව නීති පැනෙව්වේ නැත. කිසිවක් කරන්නට එපා කීවේ ද නැත. කරන්නැයි කීවේද නැත. තීරණය ගත්තේ තමන්ම ය. එනමුදු තමා ඒ තීරණය ගත්තේ සම්භාවනීය සිනමා අධ්‍යක්ෂවරයකු ලෙස ක්ෂේත්‍රයේ ඉහළ පිළිගැනීමක් ලද ඔහුගේ ගෞරවය රැකීම සඳහා නොවේ ද? සිල්ලර චිත්‍රපට වල රඟපා ඔහුගේ කීර්තිනාමයට හානියක් නොකරන්නට තමා ගත් තීරණය තවත් කොපමණ කාලයක් රැකගෙන සිටිය හැකි ද?

"මට තේරෙන්නෙ නෑ විදුල .."

"මේ අහන්න නී... මං දන්නවා ඔයාට රඟපෑමෙන් ඈත්වෙලා ඉන්න එක අමාරු බව.. ඒත් ඔයා අපට ජීවත්වෙන්න සල්ලි හොයන අරමුණෙන් ආයෙම රඟපානවා නම් ඒක කිසිම තේරුමක් වෙන වැඩක් නෙවෙයි.. ඒක තේරුම් ගන්න.. ඔයා රංගනයෙන් ඉදිරියට යන හැටි මිසක් පස්සට යන හැටි දකින්න මං කැමති නැහැ.. කරන යමක් හිතලා බලලා බුද්ධිමත්ව කරන්න.. ඔයා අඩි පහක් උඩට නැගලා ඉන්නවා නම් තවත් අඩියක් උඩට යන්නයි බලන්නයි ඕනෙ.. ඒක බැරි නම් ඉන්න පඩියේ ඉන්න එක පහළ පඩියකට බහිනවට වඩා නම්බුකාරයි.. ඒ නිසා කල්පනාවෙන් බුද්ධිමත්ව කරන යමක් කරන්න.."

ඔහු වාඩි වී සිටි පුටුව් ඉදිරියට ඇදී ඇගේ දෑත් අල්ලා ගත්තේ ය.

".. ජීවිතේ කවදාහරි දවසක ආයෙම හැරිලා බලනකොට පසුතැවිමක් ඇතිවෙන කිසිම දෙයක් අද කරන්න එපා.. මාව සතුටු කරන්නවත් එහෙම කරන්න එපා.."

00000000

තිසර සූරියබණ්ඩාර තමාගේ කාමරයට ඇතුල් වනු ලිපි ගොණුවකට මුහුණ ඔබාගෙන සිටි මදාරා දුටුවේ නැත. ඇය හිස ඔසවා බැලුවේ කිසිවකු තමාගේ මේසය ඉදිරියේ වූ පුටුවේ වාඩි වනු දැනුණ බැවිනි. තමා දෙස ම යොමුවගත් තියුණු ඇසින් බලා සිටින කථිකා-